# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2289/39 - 2022 ජූලි මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2022.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය: පීඑස්/සීඑස්ඒ/00/1/1/11

**ප්‍රකාශනයයි**

මුද්‍රාව

**රනිල් වික්‍රමසිංහ**

1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අටවැනි විධායක ජනාධිපතිවරයා වශයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් වර්ෂ දෙදහස් විසි දෙකක් වූ ජූලි මස විසි වන දින තෝරා පත්කර ගත් ලෙස ප්‍රකාශයට පත් කළ බව, පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් එකී පනතේ 17 වන වගන්තිය අනුව නිවේදනය කරනු ලැබ ඇති හෙයින්,

අතිගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා, වර්ෂ දෙදහස් විසි දෙකක් වූ ජූලි මස විසි එක් වැනි දින, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157අ (7) ව්‍යවස්ථාව සමග කියවනු ලබන 32(1) වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති ආකාරයට එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවැනි සහ හත්වැනි උපලේඛනවල දැක්වෙන ප්‍රතිඥාවන් දී ඊට අත්සන් තැබීමෙන්, එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(අ) වන ව්‍යවස්ථාව ප්‍රකාරව, වර්ෂ දෙදහස් විසි දෙකක් වූ ජූලි මස දහහතර වන දින ජනාධිපති ධුරයෙන් ඉල්ලා අස් වූ හත්වන විධායක ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ඉකුත් නොවූ ධුර කාලය සඳහා ජනාධිපති ධුරය භාරගත් බව මේ ප්‍රකාශනයෙන් නිවේදනය කර සිටිනු ලැබේ.

ඒ බව සියලු දෙනාම මෙයින් දැනගත යුතු ය.

වර්ෂ දෙදහස් විසිදෙකක් වූ ජූලි මස විසි එක් වන දින ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ දී දෙන ලදී.

ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**ඊ. එම්. එස්. බී. ඒකනායක,**
ජනාධිපති ලේකම්.

2022 ජූලි මස 21 වැනි දින,
කොළඹ 01.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 37115 — 366 (2022/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*